# අළුත්තරමේ වගාවන්–පුද්ගලික අංශය මගින් ආහාර නිෂ්පාදනය සඳහා දරණ ලද කුළුඳුල් පරිශ්‍රමයක්

**ලංකාවේ කොළඹ සීමාසහිත මුසාජීස් සමාගමේ අධ්‍යක්ෂක එස්. එම්. මුසාජී මහතා විසිනි.**

ආහාර නිෂ්පාදනය සඳහා පුද්ගලික අංශයට ඉඩම් බෙදාදිය යුතුයයි රජය තීරණය කරන ලදී. ඒ අනුව රජයේ ඉඩම් බෙදාදීමේ මේ වටිනා පරිත්‍යාගශීලී බවට මුලින්ම කැමැත්ත දැක්වූවෝ මුසාජීස් සමාගම යි. බින්තැන්නේ ආදායම් පාලක නිලධාරි තැන විසින් වෙන් කොට පෙන්වා දෙන ලද කැලෑ ඉඩම එළි පෙහෙලි කිරීම උදෙසා, බුරුමයේ හා මලයාවේ ද කැලෑ එළිකිරීම පිළිබඳ දැනුමක් සතුවූ වැඩකරුවන් කණ්ඩායමක් ඉඩම් දීමේ බල පත්‍රය ලැබූ පසු මහියන්ගනයට පිටත් කර හරින ලදී. කායික ශක්තියෙන් පමණක් වැඩ කරන කම්කරුවන් මගින් කැලෑව එළිපෙහෙලි කිරීම අරඹන ලද අතර, ආර්. එන්. අන්වින් මහතාගේ කාර්‍ය ශූර නායකත්වය යටතේ පැල්පතක් යට ජීවත් වෙමින් මෙම කම්කරුවෝ වැඩ ඇරඹූහ. ඔවුන්ට මුහුණ පෑමට සිදුවූ ප්‍රධානතම ගැටළුව වූයේ ජලය සොයා ගැනීම යි. එය ද ඔවුන්ට සොයන්නට සිදු වූයේ පොළොව අභ්‍යන්තරයෙන් ම ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන්ට රෝන්මඩ සහිත බොරදිය පානය කිරීමට ද සිදු විය. ප්‍රවේශවීමේ පාරක් තොටක් නොමැති ආහාර ඇති තැනක් පවා සොයා යෑමට එබැවින් නුපුළුවන් වූ බැවින්, ආහාර ගැටළුව ද ඉතා බැරෑරුම් විය. පිඹුරන් ගෙන් හා නොයෙක් මාදිලියේ නාගයින්ගෙන් ද වලසුන්

**මහියන්ගනයේ මුසාජීස් ගොවිපලේ වගා කර ඇති ඉන්දියාවෙන් ගෙන් වන ලද දෙමුහුන් ගන්ගා 101 නමැති බඩ ඉරිඟු වර්ගය. වගා කර ඇති අයුරු ද පසෙකින් පෙනේ.**



ගෙන්, කොටියන්ගෙන්, වල් මී හරකුන් ගෙන්, වල් ඌරන්ගෙන් හා වල් අලින්ගෙන් ගහනවූ මේ පෙදෙසේ කැලෑව බොහෝ මහන්සි වී එලිපෙහෙලි කොට මොවුන්ට මහවැලි ගං ඉවුරට සමීපවීමට හැකි වීය. හොඳින් වැඩ කිරීමට අදිටන් කර ගෙන සිටි මොවුන්ට මහවැලි ගං ඉවුරට සැපැත්වීමට පුළුවන්වීම මහත් සැනසිල්ලක් වූවාත්, හැර එහි ඔවුන්ගේ පළමු වන වාඩිය ද ඔවුහු ඉදිකර ගත්හ. වැඩකරුවන් දිරිගන්වමින් මේ ලිපියේ කර්තෘ හා ඔහුගේ භාර්යාව මේ වාඩියේ කුඩාරම යට දින ගණනක් ගත කළහ.

ඒ අනුව අද ඔවුහු අක්කර 400 ක් පමණ කැලෑව එලිපෙහෙලි කර ඇති අතර, මෙයින් අක්කර 250 ක්ම යන්ත්‍රෝපකරණ නොයොදා කම්කරුවන් තම අතින්ම කැලෑව් ඉවත් කරන ලද ඉඩම්ය. ඒ අතර, එංගලන්තයෙන් ගෙන්වන ලද ට්‍රැක්ටර් යන්ත්‍ර දෙකක් යොදා ඉතිරි අක්කර 150 එළිපෙහෙලි කරන ලදී. රට කජු, එච්-4 වී හා බඩඉරිගු මෙම ඉඩමේ පළමු වෙන්ම වගා කරන ලද බෝගයන්ය. අනතුරුව ඉන්දියාවේ රොක්පෙලර් ආයතනයෙන් මිලදී ගන්නා ලද "දෙමුහුන් ගන්ගා 101" නැමැති බඩ ඉරිගු වර්ගය ද වගා කරන ලදී. මෙම වර්ගයෙන් ද ඉතා උසස් ප්‍රතිඵල ලැබී තිබේ.

මේ ලිපියේ කතෘ ගියවර පිලිපීනයේ ලොස් බානොස්හි පිහිටි අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනයට ගිය වේලෙහි සුප්‍රසිද්ධ "අයි-ආර්-8" වී වගීයෙන් කිලෝග්‍රෑම් දෙකක් ලබා ගත්තේ ය. මෙම වී ප්‍රමාණය වගා කිරීමෙන් එකසිය වරක් වන වී රු. 450ක අස්වැන්නක් ලැබී තිබේ. එබැවින් එම වී වර්ගය නැවතත් වගා කොට බෝ කර හරිනු ඇත. ටෙක්සාස්, කොලොම්බියා, ජැමෙයිකා, කැනඩා, හොනලුලු, ටයිවේ, ඔස්ට්‍රේලියා, ජපන්, කැලිපෝනියා, තායිලන්ත හා රුසියාව යන රටවලින් ගෙන්වන ලද බඩ ඉරිඟු, සෝයා බෝංචි, ඉදැල් ඉරිඟු සහ ඇට වර්ග හා තායිවානයෙන් ගෙන්වන ලද තායිචුන් නේටිව් අංක 1 සහ ඇට වර්ග මේ ලිපියේ කර්තෘ වගා කොට ඇත. එහෙත් සෞම්‍ය සීත දේශගුණයන් යටතේ වැඩෙන බෝග වර්ග මෙහි සාර්ථක ලෙස වගා වූයේ නැත. එහෙත් ලංකා පසේ පහසුවෙන් වගා කළ හැකි කුමණ බෝග වර්ග දැයි දැන ගැනීමට කරන ලද අත්හදා බැලීම්වල ප්‍රතිඵල බොහෝ දිරිගන්වන සුළුය. දැනට අත්හදා බලා ගෙන යනු ලබන ඔස්ට්‍රේලියාවෙන් හා ඇමෙරිකා එක්සත් ජනපදයෙන් ගෙන්වන ලද කැන්ටලුප් මස්ක්මෙලන් හා වෝටර් මෙලන් නැමැති බෝග වර්ග ද මෙහි වෙති. බණ්ඩක්කා, වම්බටු, ටර්නිප් හා වට්ටක්කා යන බෝගවල විශාල අස්වැන්නක් ද මුසාජීස් සමාගම විසින් රැස්කර ගන්නා ලදී. ලංකාවේ දේශගුණයට සමාන දේශගුණයක් ඇති රටවලින් ලැබෙන ඕනෑම බෝග වර්ග යක් මහියන්ගනයේ පස සාරවත් බැවින් වගා කළ හැකිවේය යි මේ ලිපියේ කතුවරයාගේ අදහස යි. හොනලුලුවලින් ගෙන්වන ලද ස්වීට් කෝර්න් නැමැති බඩ ඉරිඟු වර්ගය මෙහිදී ද මනා ප්‍රතිඵල ලබා දී ඇත. එමෙන්ම කොලොම්බියා, ඉක්වදෝරය හා මෙක්සිකෝව යන රටවලින් ගෙන්වන ලද එලවළු හා ඉදල් ඉරිඟු වර්ග මෙහි දී මනා ප්‍රතිඵල ලබා දී ඇත. එමෙන් ම මහියන්ගනයේ මුසාජීස් ගොවි පලේ ඔස්ට්‍රේලියාවෙන් ගෙන්වන ලද වයි. ආර්. එල්. අංක 1 හා 2 යන බිත්තර වී වගී පිළිබඳව ද අත්හදා බැලීම් කර ගෙන යනු ලැබේ. ලංකාවේ එච්-4 වී වර්ගය මෙන් ම තායිචුන්නේටිව් අංක 1 හා අයි. ආර්-8 යන වී වර්ග උසස් ප්‍රතිඵල පෙන්වා ඇත. තව තවත් වැඩි වැඩියෙන් රසායනික පොහොර යෙදීමෙන් මීට වඩා උසස් අස්වනු එච්-4 නැමැති වර්ගයෙන් ලබා ගැනීමට පුළුවන් වෙනවා ඇත.

මහියන්ගන පළාතේ ඉඩම් ආහාර වගාව සඳහා පුද්ගලික අංශයේ නොයෙක් අයට බෙදා දී ඇති අතර, ඉඩම් එලිපෙහෙලි කිරීම හා බෝග සිටුවීම පිළිබඳ ව වූ බොහෝ වැඩ කටයුතු ලඟි ලඟියේ මෙහි සිදුවීගන යයි. දෙවසරකට පෙර අළුත්තරමේ ජනාවාසයක් ඇති නැති තරම් ය. එහෙත් අද මේ විශාල ගම්මානයෙහි තේ කඩ, සිල්ලර කඩ, බාබර් සැලූන් හා වෙනත් වෙළෙඳ අංශ ද බිහිවී ඇත.

වී නිෂ්පාදනය දියුණු කිරීමට අපට ආධාර කිරීම් වස් ලංකාවට පැමිණීමට ෆෝර්ඩ් පදනම සමග ගිවිසුමක් අත්සන් කිරීමෙන් ලංකා රජය ඉතා ප්‍රඥාවන්ත පියවරක් ගෙන ඇත. එමෙන් ම රොක්පෙලර් ආයතනය සමග ද ඒ හා සමාන ගිවිසුමක් රජය අත්සන් කොට

ඔවුන්ගේ නියෝජිතයෙක් මෙහි එවීමට සලස්වා වැඩියෙන් දෙ මුහුන් බඩ ඉරිඟු හා ඉදැල් ඉරිඟු නිෂ්පාදනයට කටයුතු සම්පාදන ය කළොත් නුදුරු වසර ගණනක දී මේ ද්‍රව්‍ය වලින් ලංකාව ස්වයංපෝෂිත කිරීමට පිළිවන් වනවා ඇත. මෙම ඇමෙරිකානු ආයතන දෙක බොහෝ ආසියානු රටවලට උදව් කොට ඇති බැවින්, ඔවුන්ගේ උත්සාහයන් තායිලන්ත හා ටායිවාන් යන දෙ රටේ විශේෂයෙන් ම කැපී පෙනේ.

ව්සරකට ජපන් රටට ටොන් දස ලක්ෂයක් දැන් සපයන නමුදු අවුරුදු කීපයකට පෙර තායිලන්තය බඩ ඉරිඟු නිෂ්පාදනය නො කළාය. තායි වානය ස්වයංපෝෂණය ලබා ඇතිවා පමණක් නොව, ඔවුන්ගේ සහල්, සීනි, ඇස්පැරගස් හා හතු වර්ග ලොව වෙනත් රටවල්වලට පටවයි. දැනට ලංකාවේ කෙරීගෙන යන ජාතික ආහාර නිෂ්පාදන ව්‍යාපාරයට මෙම ආයතන දෙක මගින් මහත් ආධාර ලබා ගත හැක. මෙම ලිපියේ කර්තෘ තායිවානයෙන් හතු රෝපන ද්‍රවනයක් මෙරටට රැගෙන ආ අතර, පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආචාර්ය පීරිස් මහතාගේ කාරුණික ආධාරය උඩ එම ද්‍රවනය හතු මයිසීලියා බවට පරිවර්තනය කොට ගත් බැවින්, අළුත්තරම වගාවේ දැන් එමගින් හතු නිපදවීමේ කටයුතු කෙරේ. ලෝකයේ සෑම රටකම මෙන්ම ලංකාවේ ද හතු වලට විශාල වෙළෙඳ ඉල්ලුමක් ඇත. එමෙන් ම බොහෝ දෙනෙක් වගාකරතොත් ඒවා ව්ගා කිරීමට ද එතරම් සැලකිල්ලක් ශ්‍රම යක් හෝ කාලයක් අවශ්‍ය නොවේ. ඇමෙරිකා එක්සත් ජනපදයට හා ජර්මනියට තායිවාන යෙන් පිටරට පටවන හතු සඳහා ඩොලර් ලක්ෂ විස්සක මුදලක් ඔවුහු වසරකට ව්රක් උපයා ගනිත්. ඒ අනුව ලංකාවේ මහජනයා මීට වඩා ටිකක් උනන්දු වී ආරම්භක ශක්තියක් විදහා පෑවොත්, ජාතික ආහාර නිෂ්පාදන ව්‍යාපාරය නො අනුමානවම සාර්ථක වනවා ඇත. විදේශ විනිමය හිඟකමින් දැනට රටේ පැන නැගී ඇති දුෂ්කරතාවයන් ද එමගින් එවිට මග හැරී යනවා ඇත.

**අනුවාදය—එස්. එන්. දිසානායක විසිනි.**

නිමි.



**අළුත්තරමේ වගාවට ගෙන්වන ලද ට්‍රැක්ටරයකට ඈඳ ක්‍රියාකරවිය හැකි වගාවලට පොහොර හා වල්නාශක බෙහෙත් යොදන ආම්පන්නයක් ගරු අගමැතිතුමා පිරික්සූ අයුරු. මහියංගන මන්ත්‍රී කැප්ටන් සී.පී. ජේ. සෙනෙවිරත්න උප ඇමතිතුමා හා මුසාජි මහතාද පසෙකින් සිටිති.**

# ණයදීමේ කාර්‍යයන් පිළිබඳව කාල සටහන

**ජූලි මස පළමුවන සතිය :**

නියමිත පෝරමයේ සමිතියෙන් ණය මුදල් ඉල්ලීමට කෘෂිකර්ම ව්‍යාප්ති සේවක විසින් ගොවියන් පෙළඹවීම පළාතේ නිෂ්පාදන සැලසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට ගොවියා විසින් ඉල්ලා ඇති ණය මුදල් ප්‍රමාණය සරිලන බැව් එම පෝරමවල සහතික කිරීම.

**ජූලි මස දෙවන සතිය :**

ණය ඉල්ලා ඇති සාමාජිකයින්ගේ සුදුසු නුසුදුසු භාවය සමුපකාර සමිතියේ කාරක සභාව පරීක්ෂා කර බලයි.

**ජූලි මස තුන්වන සතිය :**

සමුපකාර සමිතියේ කාරක සභාව පුද්ගලික සාමාජිකයින්ගේ ණය සීමාවන් පරීක්ෂා කර, ගොවියන්ගේ සියළුම ඉල්ලුම් පත්‍ර වෙනුවෙන් සමිතියේ එක් ඉල්ලුම් පත්‍රයක් සකස් කොට සමිතියේ සාමාන්‍යයෙන් ගනුදෙනු කරන ළඟම ඇති බැංකු ශාඛාවට යවයි.

**ජූලි මස හතරවන සතිය (ජූලි සිට සැප්තැම්බර් දක්වා) :**

ණය මුදල් දෙන බැංකුව ණය ඉල්ලුම් පත් පිරික්සා මුදා හැරීමට පුළුවන්වන උපරිම ණය මුදල තීරණය කරයි.

**ඔක්තෝබර් මස පළමුවන සතිය :**

සමිතියේ කාරක සභාව එක් එක් පුද්ගලික ඉල්ලුම් පත්‍ර දැනට ඇති සත්‍ය තත්ත්වයන් යටතේ ඇත්ත වශයෙන් වගා කෙරෙන අක්කර ප්‍රමාණයන් ආදිය ගැන කල්පනා කර බලා, සංශෝධිත ඉල්ලුම් පත්‍රයක්, ආධාර ලිපිත් සමග බැංකුවට ඉදිරිපත් කරයි.

**ඔක්තෝබර් මස දෙවන සතිය :**

මේ සතිය ඉක්මයන්ට පෙර ණය මුදලට සරිලන චෙක්පතක් බැංකුව සමිතියේ බැංකු ගිණුමට බැර කරයි.

**මෙයින් කියැවෙන්නේ කුමක් ද ?**

මෙම සඟරාවේ (පිටු 147) පළවී ඇති කෘෂිකාර්මික ණය දීමේ නව යෝජනා ක්‍රමය යන ලිපිය කියවන්න.